බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2015

01. බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **වඩු කර්මාන්ත උපදේශක**
2. **පරිගණක උපදේශක**
3. **පේෂකර්ම උපදේශක**
4. **ලෝහ කර්මාන්ත උපදේශක**
5. **සම් උපදේශක**
6. **කොහු උපදේශක**

02. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2015.06.10 වේ.

03. **පොදු කොන්දේසි**

03.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

03.2 2015.06.10 දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

03.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැකිය. පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. එවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

03.4 විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු.

04. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

තනතුර	අධ්‍යාපන සුදුසුකම් සියලු තනතුරු සඳහා අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්	වෘත්තීය සුදුසුකම්
04.1 වඩු කර්මාන්ත උපදේශක	අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල හෝ දෙමළ සහ ගණිතය ඇතුළුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්වී තිබිය යුතුය.	රජයේ හෝ රජයේ පිළිගත් වඩු කර්මාන්ත පුහුණු ආයතනයක එක් අවුරුදු වඩු පාඨමාලාව / එක් අවුරුදු වඩු කර්මාන්ත උසස් පුහුණු පාඨමාලාව හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම.
04.2 පරිගණක උපදේශක	ඉහත පරිදි වේ.	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් වසරක පරිගණක ඩිප්ලෝමාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබීම. සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක පරිගණක උපදේශක වශයෙන් වසර 2කට නොඅඩු කාලයක් සේවය කර තිබීම.
04.3 පේෂකර්ම උපදේශක	ඉහත පරිදි වේ.	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දෙ අවුරුදු පාඨමාලාව හදාරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම. හෝ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සය (06) මාසික පාඨමාලාවක් සමඟ පේෂ කර්මාන්ත / බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නියමිත ආයතනයක කාර්මිකයෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම
04.4 ලෝහ කර්මාන්ත උපදේශක	ඉහත පරිදි වේ.	රජයේ හෝ රජයේ පිළිගත් ලෝහ ඉංජිනේරු පුහුණු ආයතනයක අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබාතිබීම.
04.5 සම් කර්මාන්ත උපදේශක	ඉහත පරිදි වේ.	රජයේ හෝ රජයේ පිළිගත් සම් කර්මාන්ත පුහුණු ආයතනයක සය (06) මාසික හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම.
04.6 කොහු උපදේශක	ඉහත පරිදි වේ.	රජයේ හෝ රජයේ පිළිගත් කොහු කර්මාන්ත පුහුණු ආයතනයක සය (06) මාසික හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම

(සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් 2015.06.10 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය)

05. සේවා කොන්දේසි

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

06. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච. 06/2006(IV) අනුව රු. 13120 - 10x145 - 11x170 - 10x240 - 10x320 - 22040/- (MN - 1-2006 A) වේ.

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 පුරප්පාඩු සංඛ්‍යාව නොඉක්මවා අයදුම්පත් ලැබුණහොත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව සුදුස්සන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගැනීම සිදු කරනු ලැබේ.

7.2 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබුණහොත් ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට බඳවාගනු ලැබේ.

සටහන- බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගයේ විෂය නිර්දේශය

මෙය පහත දක්වෙන විෂයයන් 02 ක් සමන්විත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්තය.

	විෂයය	කාලය (පැය)	ලකුණු
1.	**සාමාන්‍ය දැනීම**	**01**	**100**
2.	**බුද්ධි පරීක්ෂණය**	**01**	**100**

*** සාමාන්‍ය දැනීම -**

ජාතික කලාපීය සහ ලෝකයේ විවිධ සංසිද්ධීන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, ආර්ථික වශයෙන් අදාළ කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

*** බුද්ධි පරීක්ෂණය -**

අපේක්ෂකයා සතු කරුණු නිවැරදි හා තර්කානුකූල ලෙස අවබෝධ කර ගැනීමේ බුද්ධිය හා ගණිතමය හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් වැඩියෙන් ලබාගත යුතුය.සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටි නම් සුදුස්සා/ සුදුස්සන් තෝරා ගැනීමේ තීරණය බස්නාහිර පළාත් කෘෂිකර්ම හා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් සතුය.

08. විභාග ගාස්තු -

8.1 රු. 400/- කි. මෙම විභාග ගාස්තු බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද මුල් ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

8.2 අයදුම්කරුවන් තම අයදුම්පත මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ - 4 ප්‍රමාණයේ (සෙ.මී. 21X29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් නිවැරදිව හා පැහැදිලිව පිළියෙළ කළ යුතුය. ඉල්ලුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යයෙන්ම විය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.06.10 දිනට පෙර **"ලේකම්, කෘෂිකර්ම හා කර්මාන්ත අමාත්‍යාංශය (බ.ප), තැ. පෙ. 566, ශ්‍රාවස්ති මන්දිරය, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2015"** යනුවෙන් සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. ප්‍රමාද වී හෝ අඩුපාඩු සහිතව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.3 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම් ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණක් වේනම් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එච්. තිල්ලවල,
ලේකම්,
කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,
සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර, සංස්කෘතික සහ
කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප)

ආදර්ශ අයදුම්පත
බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ
උපදේශක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2015

විභාග අංකය ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)
● ඉල්ලුම් කරනු ලබන උපදේශක තනතුර : ☐
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 වගන්ති)

01. I. මුලකුරු සමග නම (සිංහලෙන්) :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
II. සම්පූර්ණ නම (සිංහලෙන්) :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
III. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. I. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
II. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - (අදාළ කොටුව තුළ " ✔" ලකුණ යොදන්න)
කොළඹ ☐ ගම්පහ ☐ කළුතර ☐
III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2015.06.10 දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය
අවු. මාස දින
IV. දුරකථන අංකය – පෞද්ගලික : ජංගම :

03. ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ " ✔" ලකුණ යොදන්න)
ස්ත්‍රී ☐ පුරුෂ ☐

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුව තුළ " ✔" ලකුණ යොදන්න)
සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

05. I. උපන් දිනය : වර්ෂය මාසය දිනය
II. 2015.06.10 දිනට වයස : අවු. මාස දින

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 වගන්ති)

6.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය
වර්ෂය : ____________ විභාග අංකය : ____________

විෂයය ලබා ඇති සාමාර්ථය
1.
2.
3.
4.
5.
6.
7.
8.

6.2 නිවේදනයේ 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් :
6.2.1 පුහුණු පාඨමාලාවේ නම :
පුහුණු කාල සීමාව : ____________ සිට ____________ දක්වා
ආයතනය :
සහතිකය වලංගු දිනය :
6.2.2 පළපුරුද්ද පිළිබඳ විස්තර :
ආයතනයේ නම :
කාලසීමාව : ____________ සිට ____________ දක්වා

07. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත් අංකය : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :
දිනය :

මෙහි ලදුපත නොගැලවෙන සේ අලවන්න

08. ________________________________ වන මා විසින්
මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළිවුවහොත් බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය :.................................. **අයදුම්කරුගේ අත්සන.**

09. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ________________________ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ________________________ දින මා ඉදිරිපිටදී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම:
අත්සන :
තනතුර හා නිල මුද්‍රාව :

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් හමුදාවේ අධිකාරී බලපත්‍රලත් නිලධාරියෙකු හෝ වාර්ෂිකව රු. 237,060/- නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

10. **රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

________________________________ මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ ________________________ වශයෙන් ____________ දින සිට සේවය කරන බවත් තනතුර ස්ථිර කර ඇති බවත්, ඔහුගේ/ ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කර හෝ සාමාන්‍ය විනය ක්‍රියාමාර්ගයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු ලෙස සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

දිනය **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන**
(නිල මුද්‍රාව සමඟින්)